329

RARE

# මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා ආශ්‍රයෙන් තැනුණු ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා කෘති

වැලිගම පල්ලියේ ගුරුන්නාන්සේලාගේ
අනුෂා නිලුක්ෂි ද සිල්වා
බී.ඒ. ගෞරව (කොළඹ)
(මා.ශා.පී./දප/සිං./97/11)



| | |
|---|---|
| [illegible] අංකය | 329 |
| වර්ග අංකය | |



කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ
සිංහල දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.
2003 දෙසැම්බර්

# හැඳින්වීම

නවකතා මූලාශ්‍ර කොට තැනුණු සිනමා කෘතීන් වෙත අවධානය යොමු කරමින් සිදු කෙරුණු මෙම අධ්‍යයනයෙන් නවකතාවක් පාදක කර ගනිමින් නිර්මාණය වන චිත්‍රපට පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කෙරෙයි.

1947 සිට මෙතෙක් බිහි වූ නවකතා පාදක කොට ගත් චිත්‍රපට සියල්ලක් ම පිළිබඳ පුළුල් විග්‍රහයක යෙදීම මෙම අධ්‍යයනයෙහි දී අසීරු කටයුත්තක් වන හෙයින් ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ "නවකතා ආශ්‍රිත චිත්‍රපට" තෝරා ගනිමින් ඒ ඇසුරෙන් කරනු ලබන විමර්ශනයක යෙදීම මෙහි අරමුණ වී ඇත. ඒ අතුරෙන් ද මාර්ටින් වික්‍රමසිංහ කතුවරයාගේ නවකතා මූලාශ්‍ර කර ගත් චිත්‍රපට කෙරෙහි විශේෂ අවධානයක් මෙහි දී යොමු කර ඇත. එමගින් මෙම මාධ්‍යයන් දෙක පිළිබඳ අවබෝධයක් මෙන් ම එක් මාධ්‍යයකින් අනෙක් මාධ්‍යයකට නැගීමේ දී සිදු වන විපර්යාසයන් කෙරෙහි අවධානය යොමු කරමින් "නවකතාවක් මූලාශ්‍ර කර ගැනීමෙන් බිහි වන සිනමා නිර්මාණය කෙබඳු දෙයක් ද?" යන්න පැහැදිලි කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

සිනමාකරු සිය චිත්‍රපටය සඳහා නවකතාවක් තෝරා ගැනීමේ දී,

- නවකතාවෙහි ඇතුළත් අංග චිත්‍රපටයෙහි ගොඩනගා තිබෙන්නේ කෙසේ ද?
- නවකතාවෙහි ඇතුළත් චරිත, අවස්ථා හා සිද්ධි චිත්‍රපටයෙහි ගොඩනැගෙන්නේ කවරාකාරයෙන් ද?, සිනමාකරු එය සිදු කොට තිබෙන්නේ කෙලෙසින් ද?
- නවකතාවෙන් කියවෙන පණිවිඩය චිත්‍රපටයෙන් ප්‍රබල ලෙස ඉදිරිපත් වන්නේ ද?.
- නවකතාවෙහි අඩංගු දෙබස් චිත්‍රපටයට යොදාගෙන තිබෙන්නේ කෙසේ ද? එහි දී සිදු වී ඇත්තේ කෙබඳු විපර්යාසයක් ද?
- නවකතාවෙහි දිස්වන, එහෙත් චිත්‍රපටයෙහි නොමැති අංග මොනවාද?
- නවකතාවෙහි නොමැති, එහෙත් සිනමාකරු විසින් චිත්‍රපටයට එකතු කරගනු ලැබ ඇති විවිධාංග මොනවාද?

යන කරුණු කෙරෙහි මෙම අධ්‍යයනයෙහි දී අවධානය යොමු කර ඇත.

මෙහි ලා යොදාගෙන ඇති ක්‍රමවේදයට අනුව ප්‍රථමයෙන් ම නවකතාව විග්‍රහ කොට ඉන් අනතුරු ව නවකතාවෙහි ඇතුළත් පරිච්ඡේද පිළිවෙළින් චිත්‍රපටයට

ගොඩනැගී තිබෙන ආකාරය සාකච්ඡාවට භාජනය කර ඇත. නවකතාවෙහි වැදගත් හා කැපී පෙනෙන අවස්ථා චිත්‍රපටය තුළ ගොඩනැගී තිබෙන ආකාරයත්, එක ම අවස්ථාව නවකතාකරු හා සිනමාකරු ස්වකීය මාධ්‍යයන්ගෙන් විග්‍රහ කර තිබෙන ආකාරයත්, නවකතාකරුගේ දෙබස් චිත්‍රපටය නිර්මාණයෙහි ලා උපයෝගී කොට තිබෙන ආකාරයත් එකින් එක පිළිවෙළින් නවකතාවෙන් හා චිත්‍රපටයෙන් අවස්ථාවන් ගෙන විග්‍රහ කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

ඇතැම් චිත්‍රපට සම්බන්ධයෙන් මෙසේ නවකතාවෙහි හා චිත්‍රපටයෙහි දැක්වෙන අවස්ථා පිළිවෙළින් ගෙන විග්‍රහ කිරීම අපහසු කාර්යයක් විය. ඒවා නවකතාවෙහි ඇතුළත් පරිච්ඡේද අනුව විග්‍රහ කිරීම ද අසීරු විය. එහෙයින් නවකතාව හා චිත්‍රපටය ගොඩනැගී තිබෙන ආකාරය සන්සන්දනාත්මක ව ගෙන විග්‍රහ කිරීමට සිදු විය.

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා කෘතීන් ගතහොත් ඔහුගේ චිත්‍රපට කලාව නම් නිසැක ව ම සාහිත්‍යය හා බැඳුණකි. එය බැඳී තිබෙන්නේ වෙසෙසින් ම නවකතා කලාව හා සමගයි. ඔහුගේ චිත්‍රපට අතුරෙන් බහුතරයක් වීර ප්‍රසිද්ධ සිංහල නවකතා පදනම් කොටගෙන තැනුණු ඒවා ය.

මේ වන විට ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් විසින් නිර්මාණය කරන ලද වෘත්තාන්ත චිත්‍රපට සංඛ්‍යාව දහ නවයකි. (තිරගත වීමට නියමිත "වැකන්ද වලව්ව" චිත්‍රපටය ඇතුළුව) රේඛාව, සංදේශය, ගම්පෙරළිය, දෙලොවක් අතර, රන්සළු, ගොළු හදවත, අක්කර පහ, නිධානය, දැස නිසා, මඩොල්දූව, The God King, අහසින් පොළොවට, වීර පුරන් අප්පු, බැද්දේගම, පිංහාමි, කලියුගය, යුගාන්තය, අවරගිර, වැකන්ද වලව්ව එම චිත්‍රපටයි. මෙම චිත්‍රපටවලින් නවයක් ම නවකතා පාදක කර ගත් ඒවා ය. එයිනුත් "ගම්පෙරළිය", "කලියුගය", "යුගාන්තය","මඩොල්දූව" යන චිත්‍රපට මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා මුලශ්‍ර කොට නිර්මාණය කළ ඒවා ය. "ගොළු හදවත" කරුණාසේන ජයලත්ගේ එනමින් ම යුත් නවකතාව ඇසුරින් ද, "අක්කර පහ" මඩවල එස්. රත්නායකගේ එනමින් යුත් නවකතාව ඇසුරින් ද, "බැද්දේගම" ලෙනාඩ් වුල්ෆ්ගේ "The Village in the Jungle" නම් වූ නවකතාව ඇසුරින් ද, "අහසින් පොළොවට" අයිලින් සිරිවර්ධනගේ එනම් නවකතාව ඇසුරින් ද, "අවරගිර" ජී.බී. සේනානායකගේ එනම් නවකතාව ඇසුරින් ද නිර්මාණය කරන ලද ඒවා ය. එම නවකතාවන්ගෙන් කිපයක් වූ කලී විවිධත්වයෙන්, ගැඹුරු බවින් හා චරිත නිරූපණයෙන් ද, සිංහල ප්‍රබන්ධ කතා සාහිත්‍යයේ ඉතා ම සාරවත් නිර්මාණ වේ.

මෙම නිබන්ධයෙහි පළමුවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙන්නේ නවකතාව හා චිත්‍රපටය යන මාධ්‍ය ද්වය පිළිබඳ ව ය. නවකතාවේ හා චිත්‍රපටයේ දිස්වන සමාන,

අසමානතා විමසමින් එම මාධ්‍යයන්ගේ ස්වභාවය සන්සන්දනාත්මක ව විවරණය කිරීමක් මෙහි දී සිදු වේ.

දෙවන පරිච්ඡේදයෙන් සාකච්ඡාවට භාජනය කෙරෙන්නේ නවකතාව හා චිත්‍රපටය යන මාධ්‍ය ද්වයෙහි දිස්වන විශේෂ ලක්ෂණ පිළිබඳ ව ය. එම මාධ්‍යයන්ට ම ආවේණික වූ ලක්ෂණයන් මෙන් ම ඒවායින් ප්‍රකට වන විවිධතා හා විශේෂතා ද මෙහි දී සාකච්ඡා කෙරේ. එසේ ම චිත්‍රපටයට නවකතා පාදක කර ගැනීමේ දී සිනමාකරුට මුහුණ පෑමට සිදුවන විපර්යාසය ද මෙහි දී අවධාරණය කෙරේ.

මාර්ටින් වික්‍රමසිංහ හා ඔහුගේ සාහිත්‍ය කෘතීන් පිළිබඳ ව තුන්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ. එහි දී ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා නිර්මාණ සඳහා පාදක කොට ගත් මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා වන "ගම්පෙරළිය", "කලියුගය", "යුගාන්තය" හා "මඩොල් දූව" යන කෘතීන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

හතරවන පරිච්ඡේදයේ දී ලෙස්ටර් ජේම්ස් පීරිස් හා ඔහුගේ සිනමා කෘති පිළිබඳ ව විමසා බැලේ. මෙහි දී විශේෂ අවධානයක් යොමු වන්නේ මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා මූලාශ්‍ර කොට තැනුණු ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ "ගම්පෙරළිය", "කලියුගය", "යුගාන්තය", "මඩොල්දූව" යන චිත්‍රපට කෙරෙහි ය. තව ද, නවකතා පාදක කොටගෙන තැනුණු චිත්‍රපට සම්බන්ධයෙන් ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් සමග පැවැත්වූ විශේෂ සාකච්ඡාවක් ද, හතරවන පරිච්ඡේදයට ම ඇතුළත් කොට ඇත. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් හා කළ එම සාකච්ඡාවෙන් නවකතා මූලාශ්‍ර කොට ගත් චිත්‍රපට පිළිබඳ ව මූලික කරුණු රැසක් අනාවරණය වේ.

~~~~~~~~~~~~~~~~~~
~~~~~~~~~~~~~~~~~~